135

පරිපාලන චක්‍රලේඛ අංක:-2007/02

මගේ අංකය:-ආර්ඩීඒ/ඒ/ඩීඑල්/ජීඑන්
මාර්ග සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය
බත්තරමුල්ල.

2007.02.05

සියලුම අධ්‍යක්ෂවරුන්,
ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්,
පළාත් භාර අධ්‍යක්ෂවරුන්,
ප්‍රධාන ඉංජිනේරුවරුන්,
විධායක ඉංජිනේරුවරුන්,
දිසා යාන්ත්‍රික ඉංජිනේරු , මරදාන
ප්‍රධාන ගබඩා සම්බන්ධතා නිලධාරි, මරදාන.

**ආපදා ණය ගෙවීම**

ආපදා ණය, නිවාස ණය, සහ වාහන ණය ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2006.03.01 දිනැති අංක 2006/04 පරිපාලන චක්‍රලේඛය හා බැදේ.

ආපදා ණය ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 133 සහ 2006.12.29 දිනැති චක්‍රලේඛයේ 4.2 ඡේදයේ සඳහන්ව ඇති උපදෙස් අනුව 2007.01.01 දින සිට දීමනා හැර මූලික වැටුප පදනම් කර ගෙන ආපදා ණය නිකුත් කිරීමට තීරණය කර ඇති බව දන්වමි.

එසේ ආපදා ණය නිකුත් කිරීමේ දී පහත සඳහන් පරිදි කටයුතු කරනු ලැබේ.

1. කණිෂ්ඨ ශ්‍රේණිවල සේවකයන් සහ පළමු වතාවට ආපදා ණය ඉල්ලුම් කරන සේවකයින්හට ප්‍රමුඛත්වය ලබාදේ.
2. සේවකයෙකු කලින් ලබා ගත් ආපදා ණය මුදලින් 2/3 ආපසු ගෙවා ඇත්නම් පමණක් නැවත ණය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.
3. ආපදා ණය මුදලින් 2/3 සම්පූර්ණවීම සඳහා අදාළ මුදල එකවර ආපසු ගෙවනු ලබන සේවකයින්ට ආපදා ණය මුදල නැවත ගෙවනු ලැබේ. එසේ ගෙවනු ලබන්නේ ඉහත 1 යටතේ සඳහන් සේවකයින් සඳහාත්, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ගෙවීම් සඳහාත් ප්‍රතිපාදන තිබේ නම්, පමණක් වන අතර පොරොත්තු ලේඛණයේ අනුපිළිවෙලද අනුවය.

ඊට අමතරව ආපදා ණය නිකුත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද චක්‍රලේඛවල අඩංගු අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

කරුණාකර මෙම චක්‍රලේඛය ඔබ කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ / සේවකයින්ගේ දැනගැනීම සඳහා යොමු කරන්න.

**සාමාන්‍යාධිකාරී**
**මාර්ග සංවර්ධන අධිකාරිය.**

පිටපත්:-
(1). විගණකාධිපති
(2). ලේකම්, මහා මාර්ග
(3). සභාපතිතුමා,
(4). නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්.

ජාලි/